04. ගුවන් තොටුපළ හරහා ශ්‍රී ලංකාවට ඇතුළුවීමේදී අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග -

(අ) විදේශ දූත මණ්ඩලයක් හරහා අයදුම් කොට ගමන් බලපත්‍රයක් ලබාගත් පුද්ගලයන් ශ්‍රී ලංකාවට පැමිණෙන පළමු අවස්ථාවේදී ආගමන විගමන කවුළුව (Immigration counter) වෙත නොගොස් සෘජුවම **ප්‍රධාන ආගමන** නිලධරයා **වෙත වාර්තා කිරීම කළ හැකිය.** එසේත් නැතිනම් ආගමන විගමන කවුළුව වෙත ගොස් ආගමන විගමන නිලධරයාගේ උපදෙස් අනුව **ප්‍රධාන ආගමන නිලධරයා වෙත ඔවුන්ව යොමු කෙරෙනු ඇත.** අනතුරුව **ප්‍රධාන ආගමන නිලධරයා විසින්** සුවිශේෂි යොමු අංකයකින් යුත් ස්වයංක්‍රීයව නිකුත් කරනු ලබන (System generated) ජෛවමිතික දත්ත ලබා ගැනීමේ ආකෘති පත්‍රිකාවක් (BDA පත්‍රිකාව) පිටපත් දෙකකින් යුතුව නිකුත් කරනු ලැබේ. මින් එක් ආකෘති පත්‍රයක් ආගමන හා විගමන දෙපාර්තමේන්තුවේ ජෛවමිතික දත්ත ලබා ගන්නා අවස්ථාවට ඉදිරිපත් කිරීම සඳහා එම පුද්ගලයා වෙත ලබාදෙනු ලැබේ.මෙම ජෛවමිතික දත්ත ලබා ගැනීමේ ආකෘති පත්‍රය (BDA) ඇමුණුම 'C' වශයෙන් අමුණා ඇත.

(ආ) ගුවන් තොටුපළෙහි ජෛවමිතික දත්ත ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් නොමැති බැවින් මේ සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත පැමිණිය යුතුය.

05. ශ්‍රී ලංකාවට ඇතුළු වීමෙන් අනතුරුව අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග -

(අ) ජෛවමිතික දත්ත ලබාදීම සඳහා බත්තරමුල්ලේ පිහිටි ප්‍රධාන කාර්යාලය වෙත හෝ එහි ඕනෑම ප්‍රාදේශීය කාර්යාලයකට වාර්තා කළ හැකිය. මෙම කාර්යය සඳහා විශේෂ කවුළුවක් (Special Counter) විදේශ දූත මණ්ඩල අංශයෙහි ස්ථාපිත කරනු ලබන අතර, ඇඟිලි සලකුණු ලබාදීම වෙනුවෙන් කිසිදු ගාස්තුවක් අය කරනු නොලැබේ.

(ආ)ජෛවමිතික දත්ත ලබාදීමේදී සිදුවන අනවශ්‍ය ප්‍රමාදවීම් වළක්වා ගැනීමට දෙපාර්තමේන්තු වෙබ් අඩවිය ඔස්සේ දිනය සහ වේලාව වෙන්කර ගැනීමට අන්තර්ජාල මාර්ගගත වෙන්කිරීමේ ක්‍රමවේදය(Online Booking) මගින් පහසුකම් සලසා ඇත.

(ඇ) ජෛවමිතික දත්ත ලබා දීමෙන් අනතුරුව ජෛවමිතික තොරතුරු ලබා ගැනීමේ ක්‍රමවේදය සම්පූර්ණ කිරීම සනාථ කිරීමට අදාළව ස්වයංක්‍රීයව නිකුත් කරන ලද (System generated) සහතිකපතක් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අතර, විධිමත්ව ජෛවමිතික තොරතුරු ලබාදුන් පුද්ගලයන්ට ඕනෑම අවස්ථාවක රටින් පිටත් වීමට හැකිවන පරිදි ප්‍රත්‍යන්ත පාලන පද්ධතිය යාවත්කාලීන කරනු ලැබේ.**ජෛවමිතික දත්ත ලබා ගැනීමේ ක්‍රමවේදය නිම කිරීම සඳහා නිශ්චය කරන ලද කාලය සාමාන්‍යයෙන් විනාඩි** 45 කි.

(ඈ) මෙම ජෛවමිතික දත්ත ලබා ගැනීමේ ක්‍රමවේදය හේතුවෙන් දැනට භාවිතා කරන ගමන්බලපත්‍රෙහි ඇතුළත් තොරතුරු වල කිසිදු වෙනසක් සිදු නොවේ.